**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

**---------**

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

**1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**------------------------------------**

එකතුව රු.114,127,607 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි/කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය රු.410,808 ක්වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,316,114 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1** **මුද්දර ගාස්තු ආදායම්.**

-------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව මුද්දර ගාස්තු 2012, 2013, හා 2014 වර්ෂවලට අදාළව සභාවට ලැබිය යුතු රු.3,498,750 ක් සභා අරමුදලට බැර කර නොතිබුණි.

**2.2.2** **දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු.**

-----------------------------------

ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව දූරකථන /විදුලි සංදේශ කුළුණු සඳහා උස අනුව ගාස්තු අයකළයුතු වුවත්, සම්ප්‍රේෂණ කුළුණු 05 ක් සඳහා එපරිදි ගාස්තු අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතුව පවතින පරිගණක යන්ත්‍ර, උපාංග, මෘදුකාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**3.2** **නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්.**

-----------------------------------------

සභාව සතු රු.541,000 ක් වටිනා සහල් පිටි කිරීමේ යන්ත්‍රය වසර 05 කට අධික කාලයක් පුරා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.** **පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය